**ශීර්ෂය 159 - සංචාරක අමාත්‍යාංශය**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සංචාරක අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංචාරක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූනි 30 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට සංචාරක අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

--------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

**1.6.1** **මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම**

--------------------

**(අ)** **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

--------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව ආදායම් නොවන ලැබීම් රු.4,953,584 ක් වූ අතර , විගණනයට ඉදිරිපත් කරන ලද ශේෂ පිරික්සුමට අනුව එය රු. 4,170,478 ක් විය. ඒ අනුව රු. 783,106 ක වෙනසක් විය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ අරමුණ වන්නේ මුදලින් ලැබීම් හා සත්‍ය වශයෙන් මුදලින් කරනු ලබන ගෙවීම් කවරේද යන්න දැනගැනීමය. ඒ අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීම සත්‍ය වශයෙන් මුදල් ලැබීම් හා ගෙවීම් පදනම මත පිළියෙල කිරීම සාමාන්‍ය සම්ප්‍රදාය වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයට හරස් සටහන් මඟින් කරනු ලබන ලැබීම් හා ගෙවීම් ඇතුලත් කරනු නොලැබේ. එකී පදනමේ පිහිටා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර ඇත.ශේෂ පිරික්සුම සඳහා හරස් සටහන්ද ඇතුලත් කර ඇත. | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 6 වන ඡේදය පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය දල පදනමින් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් රු. 134,554,175 ක් වූ අතර , විගණනයට ඉදිරිපත් කරන ලද ශේෂ පිරික්සුමට අනුව එය රු. 165,428,144 ක් විය. ඒ අනුව රු. 30,873,969ක වෙනසක් විය. . | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස්කිරීමේදී ශුද්ධමුදල් ලැබීම් හා ගෙවීම් පදනම්කරගෙන ඇත. ඒ අනුව පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්වලට අදාලව හරස් සටහන් ඉවත් කල පසු ලැබෙන අගය මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුලත් කර ඇති අතර ශේෂ පිරික්සුමෙහි හරස් සටහන්ද සමඟ අගය පෙන්නුම් කරන බැවින් මෙම ශේෂය නිරීක්ෂණය වේ. | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 6 වන ඡේදය පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය දල පදනමින් සකස් කළ යුතුය. |
| **(iii)** | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම රු. 29,530,599 ක් වූ අතර , ශේෂ පිරික්සුමට අනුව එය රු.30,390,753 ක් විය. ඒ අනුව රු. 860,154 ක වෙනසක් විය. | 2020 වර්ෂයේ මුල් මාස කිහිපය තුල සංචාරක රාජ්‍ය අමාත්‍යවරයා සහ එම කාර්ය මණ්ඩලයට අදාල නිලධාරීන්ගේ වියදම් මෙම අමාත්‍යාංශය මඟින් දැරීමට කටයුතු කර ඇත. පසුව රාජ්‍ය අමාත්‍යාංශය වෙනම ආරම්භ කරන ලද බැවින් ඒ වෙනුවෙන් වර්ෂය තුලදී දරණ ලද වියදම් 437 රාජ්‍ය අමාත්‍යාංශ වැය ශීර්ෂයට හර කිරීමට කටයුතු කරන ලදී. තවද උපාධිධාරී පුහුණු අභ්‍යාසලාභී වැටුප් හා SAIL ව්‍යාපෘතියට අදාල වෙළඳ අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන වර්ෂය තුලදී වැය දැරීමට කටයුතු කර ඇත. එය සමස්ථයක් ලෙස රු.29,530,599/- ක් වන අතර එය ශේෂ පිරික්සුමේ ඇති අගයන්ට සමාන වේ. | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 6 වන ඡේදය පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය දල පදනමින් සකස් කළ යුතුය. |
| **(iv)** | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් සඳහා වියදම රු. 35,494,618 ක් වූ අතර , ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව එය රු. 8,305,632 ක් විය. ඒ අනුව රු. 27,188,986 ක වෙනසක් විය. | ජාතික අයවැයෙන් සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා වෙන් කල ප්‍රතිපාදන තුලින් අත්පත් කර ගත් භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් සඳහා වන සත්‍ය මුදල් ගෙවීම් ප්‍රමාණය වන රු.35,494,618/- ක් වන මුදල, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇත. | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 6 වන ඡේදය පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය දල පදනමින් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(v)** | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව අත්තිකාරම් ගෙවීම් රු. 2,644,002 ක් වූ අතර , ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව එය රු. 5,570,977 ක් විය. ඒ අනුව රු. 2,926,975 ක වෙනසක් විය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කරනු ලබන්නේ සත්‍ය මුදල් ලැබීම් හා ගෙවීම් පදනම් කරගෙන වන අතර ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේදී සියළු හරස් සටහන්ද අදාල කරගෙන ඇත. රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම යටතේ 2020 වර්ෂයේදී සත්‍ය ණය ගෙවීම්සිදු කර ඇත්තේ රු.2,644,002/- ක් පමණි. ශේෂ පිරික්සුමෙහි දක්වා ඇති රු. 5,570,977/- න් රු.2,926,975.44 ක්ම වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන්ගේ ණය පියවීම්වලට අදාල වටිනාකම්ය. ඒවා ගිණුම් සාරාංශ මඟින් හරස් සටහන් මාර්ගයෙන් සිදු කරනු ලබන බැවින් ශේෂ පිරික්සුමෙහි පෙන්නුම් කලද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නොදක්වයි. | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 6 වන ඡේදය පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය දල පදනමින් සකස් කළ යුතුය. |
| **(vi)** | ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව අත්තිකාරම් අයකර ගැනීම් රු. 5,794,774 ක් වූ අතර එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | මෙසේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමට අදාල මෙම ලැබීම් සියල්ල මෙම අමාත්‍යාංශ නිලධාරීන්ගේ වැටුප් වලින් අයවන ණය වාරික හා මෙම අමාත්‍යාංශයට වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ ලැබීම්වේ. මෙම සියලු ලැබීම් ගිණුම් සාරාංශ මඟින් මුදල් නොවන හරස් සටහන් මාර්ගයෙන් ලැබෙන ලැබීම් බැවින් ඒවා මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුලත් කර නොමැති අතර ශේෂ පිරික්සුමෙහි සියළු ආකාර ලැබීම් හා ගෙවීම් අන්තර්ගත කරනු ලබන බැවින් එයට පමණක් ඇතුලත් කර ඇත. | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 6 වන ඡේදය පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය දල පදනමින් සකස් කළ යුතුය. |
| **(vii)** | . මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව තැන්පත් ගෙවීම් රු. 2,219,779 ක් වූ අතර , ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව එය රු. 2,258,732 ක් විය. ඒ අනුව රු. 38,953 ක වෙනසක් විය. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත්තේ සත්‍ය මුදල් ලැබීම් හා ගෙවීම් පදනම් කරගෙනය. ඒ අනුව තැන්පත් ගිණුමට අදාල ශුද්ධ ගෙවීම් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් කර ඇත. | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 6 වන ඡේදය පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය දල පදනමින් සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (viii) | ඒකාබද්ධ ශේෂ පිරික්සුමට අනුව තැන්පත් ලැබීම් රු. 2,247,297 ක් වූ අතර , මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පත් ලැබීම් දක්වා නොතිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇත්තේ සත්‍ය මුදල් ලැබීම් හා ගෙවීම් පදනම් කරගෙනය. ඒ අනුව තැන්පත් ගිණුමට අදාල ශුද්ධ ලැබීම් පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුලත් කර ඇත. | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 6 වන ඡේදය පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය දල පදනමින් සකස් කළ යුතුය. |

**(ආ) ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අමාත්‍යාංශ මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලනයක් සහිතව මු.රෙ.135-138 ප්‍රකාරව බලතල පවරා ඇති අතර ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයෙකු සහිතව අභ්‍යන්තර විගණක අංශයක්ද ස්ථාපිත කර ඇත. | පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමෙන් පසුඵම සමාලෝචනයන් පිළිබඳව ලිඛිත පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |

(ඇ) **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | | |
| | රු. | | | |
| අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | - | (i)2020 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැළැස්මේ යාවත්කාලීන කරන ලද සංවිධාන සටහන සහ අනුමත කාර්යය මණ්ඩලය හා දැනට සේවයේ නියුතුව සිටින කාර්යය මණ්ඩලය පිළිබඳ දත්ත ඇතුලත්කර නොතිබුණු අතර ක්‍රියාකාරී සැළැස්ම සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා අතුරු සම්මතගිණුම් මගින් ප්‍රතිපාදන වෙන් වූ බැවින් එක් එක් කාලසීමා සඳහා ක්‍රියාකාරී සැලැසුම් සකස් කිරීමේදී සංවිධාන සටහන, අනුමත කාර්යමණ්ඩලය පිළිබඳ දත්ත, යාවත්කාලීන කර නොමැති බව නිරීක්ෂණය වේ.එසේ වුවද 2021 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම මේ වන විට සකස් කර ඇති අතර කාර්ය මණ්ඩලයට අදාළ නිවැරදි තොරතුරු එයට ඇතුලත් කර තිබේ. එමෙන්ම 2020 වර්ෂයේ අමාත්‍යාංශය විසින්ක්‍රියාත්මක කරන ලද සංවර්ධන කාර්යන්හි 2020.12.31 දිනට ප්‍රගතිය මේ සමග ඉදිරිපත් කරමි. | චක්‍රලේඛයට අනුගත විය යුතු අතර ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii)2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්යය සාධන වාර්තාව පිළියෙල කල යුතුව තිබුණ නමුත් එය පිළියෙල කර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව 2020 වර්ෂය සඳහා වන කාර්ය සාධන වාර්තාව මේ වනවිට සැලසුම් අංශයේ සකස් කරමින් පවතී. සියලු තොරතුරු ඇතුලත් එම කාර්යසාධන වාර්තාව භාෂා ත්‍රිත්වයෙන් සකස්කර මුදල් වර්ෂය අවසන් වී (2020.12.31) දින 150 ක් ගත වීමට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා මේ වන විට අවශ්‍ය මූලික පියවර ගනිමින් සිටින බව කාරුණිකව දන්වා සිටිමි. | චක්‍රලේඛයට අනුගත විය යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය විසින් සැලසුම් කල මුළු අග්‍රිම රු.370,648,500 ක් වූ අතර, ලැබුණු අග්‍රිම රු.200,037,000 ක් විය. මේ අනුව සැලසුම් කල ප්‍රමාණයෙන් ලැබී තිබුණේ සියයට 54 ක ප්‍රමාණයක් පමණි. | වර්ෂය මුලදී අක්මුදල් සැලැස්ම අයවැයගත ප්‍රතිපාදන ප්‍රමාණය පදනම් කරගෙන පිළියෙල කරනු ලබන අතර ඒ මත පදනම්ව මාසික අග්‍රිම අවශ්‍යතා ඉල්ලුම් කරනු ලබයි. කෙසේ නමුත් අදාල මාසයේදී ඉල්ලුම් කරනු ලබන අක්මුදල් ප්‍රමාණය සම්පූර්ණයෙන්ම එම මාසයේදී නොලැබුණොත් එසේ නොලැබෙන ප්‍රමාණයන් නැවත | සැලසුම් කල පරිදි අග්‍රිම ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | ඊළඟ මාස වලදී ඉල්ලුම් කරනු ලබයි. මේ හේතුවෙන් ඉල්ලුම් කරනු ලැබූ අක්මුදල් ප්‍රමාණයේ වැඩි අගයක් පෙන්නුම් කරනු ලබයි. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත අක්මුදල් අවශ්‍යතා දැනුම් දුන් පසු ලබාදෙන අක්මුදල් ප්‍රමාණය කළමනාකරණය කර ගනිමින් කටයුතු කිරීම අමාත්‍යාංශය විසින් සිදුකරනු ලබයි. | |

**2.2** **වියදම් කළමනාකරණය**

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සඳහා සහ මූලධන වැය විෂයයන් 05 ක් සඳහා වීරමොං පටිපාටිය යටතේ පිළිවෙළින් රු.1,561,600 ක් සහ රු.5,313,850 ක් ද වශයෙන් එකතුව රු.6,875,450 ක අතිරේක ප්‍රතිපාදන මාරු කර ගෙන තිබුණි. එම ප්‍රතිපාදන මාරු කිරීම් ප්‍රතිශතය මුල් ඇස්තමේන්තු මුදලට සාපේක්ෂව බැලූ විට සියයට 3 සිට සියයට 5387 ක පරාසයක අගයන් වීම හේතුවෙන් මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කර නොමැති බව අනාවරණය විය. | ප්‍රධාන වශයෙන්ම වීරමොං පටිපාටිය යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් සිදු කර ඇත්තේ ගොඩනැගිලි නඩත්තු වැය විෂයට වන අතර එයට හේතුව වී ඇත්තේ අමාත්‍යාංශය 2020 දෙසැම්බර් මාසයේදී වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමයි. එහිදී දැරීමට සිදුවූ කාමර වෙන් කිරීම් හා පෙර ගොඩනැගිල්ලේ වූ සවි කිරීම් ගලවා නව ගොඩනැගිල්ලේ සවිකිරීම සඳහා වූ වියදම් පියවා ගැනීම පිණිස මෙසේ ප්‍රතිපාදන මාරු කිරීම් සිදු කර ඇත.<br><br>මෙහි පැවති වසංගත තත්ත්වය හේතුකොට ගෙන බොහෝ වියදම්වල අඩු වීමක් පෙන්නුම් කෙරුණු අතර අමාත්‍යාංශය වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීම හේතුවෙන් ඇතැම් වැය විෂයන් වල වියදම් වැඩිවීමක් අපේක්ෂා කරන ලදී. ඒ අනුව ප්‍රතිපාදන ඉතිරි වූ වැය විෂයන්ගෙන් අයවැය ප්‍රමාණවත් නොවූ වැය විෂයන් සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීම සිදු කරන ලදී. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| | තවද අයවැය 100% ක අඩුවීමක් පෙන්නුම් කරනු ලබන්නේ නිලධාරීන්ගේ නිල ඇඳුම් සඳහා අයවැය මඟින් වෙන්වූ රු.3000/- ක මුදලක් වන අතර එය ගරු අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලයේ ස්ථිර නිල ඇඳුම් දීමනා හිමි නිලධාරීන් නොමැති වීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම වෙනත් වැය විෂයකට මාරු කිරීමට කටයුතු කර ඇත. | |

**2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------------- | ------------------------------------ | ------------------------- |
| (අ) | මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වර්ෂය අවසානයේදි ඇස්තමේන්තුගත මුදලින් තවදුරටත් ප්‍රතිපාදන ඉතිරිව ඇත්නම් පමණක් බැදීම් වලට එළඹිය යුතු වුවත් අමාත්‍යාංශයේ වැය විෂයයන් 15 ක ඉතිරියට ඉක්මවා එකතුව රු.8,584,685 ක් වූ බැරකම් වලට එළඹ තිබුණි. | අත්‍යාවශ්‍ය කටයුතු වලදී මෙම බැදීම් ඇති වී අතර එබැවින් එක් බැදීමක් හැර අනෙකුත් සියළුම ඒවා පුනරාවර්තන වියදම් සම්බන්ධයෙන් සිදු වී ඇත. කෙසේ නමුත් ඉදිරියේදී මෙවැනි අවස්ථා ඇති නොවීමට වගබලා ගන්නා බව කාරුණිකව දන්වමි. | මුදල් රෙගුලාසිවලට අනුකූලව බැරකම් වලට එළඹීමට කටයුතු කළයුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ 06 හි 3.4 ඡේදය පරිදි මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර ඇති සටහන් අංක iii යටතේ වන බැදීම් හා බැරකම් ප්‍රකාශය, භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂ වලට නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය(SA 92) සමඟ සැසඳී තිබිය යුතු වුවද බැදීම් හා බැරකම් සටහන් අංක iii යටතේ වන බැදීම් හා බැරකම් එම ප්‍රකාශයේ දක්වා නොතිබුණි. තවද භාණ්ඩාගාරයේ බැදීම් හා | මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම සෑම වර්ෂයකම පෙබරවාරි 28 දිනට පෙර සිදු කල යුතුය. මෙම බැදීම් හා බැරකම් අමාත්‍යාංශයේ විවිධ අංශ විසින් ඇති කර ගනු ලබන අතර මූල්‍ය ප්‍රකාශන පිලියෙල කල යුතු අවසන් දින වන විට ගිණුම් අංශයට වාර්තා වී තිබූ ගණුදෙනු පමණක් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් කරනු ලබයි. මූල්‍ය රෙගුලාසි අනුව මාර්තු 31 දින දක්වා පසුගිය වසරේ ගෙවීම් මු.රෙ.115 අනුමැතියකින් තොරව ගෙවීම් කිරීමට ඉදිරිපත් වන බැවින් මෙම තත්වය ඇති වී ඇති බව පෙන්වා දෙමි. | අමාත්‍යාංශයේ බැදීම් හා බැරකම් ප්‍රකාශයන් භාණ්ඩාගාර ප්‍රකාශ සමඟ සැසඳී තිබිය යුතු අතර භාණ්ඩාගාරයේ බැදීම් හා බැරකම් ප්‍රකාශයේ වාර්තා නොකළ කිසිදු බැදීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදමක් සේ සලකා නිරවුල් නොකළ යුතුය. |

බැරකම් ප්‍රකාශයේ වාර්තා නොකළ කිසිදු බැදීමක් හෝ බැරකමක් පෙර වර්ෂයේ වියදමක් සේ සලකා නිරවුල් නොකළ යුතු වුවත්, 2021 වර්ෂයේදී සමාලෝචිත වර්ෂයේ බැරකම් ලෙස සටහන් නොවූ රු. 15,237,602 ක් නිරවුල් කිරීමට කටයුතු කර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 රජයේ නිලධාරීන් ඇප තැබීම

පහත සඳහන් නිරීක්ෂණය සිදුකරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 880 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව රජයේ මුදල්, ආදායම්, මුද්දර හෝ බඩු බාහිරාදිය , භාර ගැනීම හෝ භාරව සිටීම, නැතහොත් රජයේ මුදල්, මුද්දර නැතහොත් බඩු බාහිරාදිය බෙදා හැරීම හෝ නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිවයුතු නිලධාරීන් ද , රජයේ ගිණුමට අදාල වවුචර, සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද, ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවද, අමාත්‍යාංශයේ ඇතැම් නිලධාරීන්ගෙන් එසේ ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 880 විධිවිධාන ප්‍රකාරව කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |